පුනරුත්ථාපන කාර්යාංශය
புனர்வாழ்வுப் பணியகம்
**BUREAU OF REHABILITATION**
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
நீதி மற்றும் தேசிய ஒருமைப்பாடு அமைச்சு
MINISTRY OF JUSTICE AND NATIONAL INTEGRATION

MGMT. SYS. RvA C 155 | SLAB ISO/IEC: 17021 EMS-001-01 | SLSI ISO 9001

අංක: 462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල.
இல: 462/2, கடுவெல வீதி, கனஹேன, பத்தரமுல்ல.
**No: 462/2 , Kaduwela Road, Ganahena , Battaramulla.**


මගේ අංකය / எனது இல / My No } BR/PROC/HQ/2025/002

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2025.01. 31

මහත්මයාණෙනි,

<u>මිල කැඳවීමේ නිවේදනය සහ ටෙන්ඩර් කොන්දේසි : Server Edition Virus Guard 2025 වෛරස් ආරක්ෂණ පද්ධති 01ක් හා Single User Virus Guard 2025 ගණනින් 134ක් මිලදී ගැනීම.</u>

1. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම කාර්යාංශය වෙතින් මෙයට ඇමුණුම "අ" යටතේ දක්වා ඇති උපලේඛණනය අනුව එහි සඳහන් භාණ්ඩ/සේවාව සැපයීම සඳහා මිලගණන් කැඳවනු ලැබේ.

2. <u>මිලගණන් කැඳවනු ලබන දිනය සහ වේලාව</u> : මෙම මිළගණන් 2025.02 .11 දින 1030 පැයට වසනු ලැබේ. එම දින එම වේලාවෙන් පසුව මිලගණන්පත් භාර ගනු නොලැබේ. මෙම දින නියමිත වේලාවට පසුව ඉදිරිපත් කරනු ලබන මිලගණන්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. <u>මිලගණන්පත් වලංගු කාලය</u> : සියලුම මිලගණන්පත් අවම වශයෙන් <u>ඒවා විවෘත කරන දින සිට දින 60ක් ඉදිරියට වලංගු විය යුතුය.</u>

4. ඔබගේ මිළ ගණන්පත් පහත සඳහන් කොන්දේසි යටතේ ඉදිරිපත් කළ යුතුය.

   අ. මිල නියම කරන භාණ්ඩ/සේවාව උසස් ප්‍රමිතියකින් යුක්ත විය යුතු අතර, වර්තමානයේ භාවිතාවන නවීනතම වෛරස් ගාඩ් යෙදවුම් විය යුතුවේ.

   ආ. සැපයුම්/සේවාව සඳහා මුදල් ගෙවීම සිදු කරනු ලබන්නේ භාණ්ඩ/සේවාව සැපයීමෙන් පසුව වේ.

5. <u>එකතුකල අගය මත බදු සඳහා ලියාපදිංචිය</u>: දේශීය වශයෙන් භාණ්ඩ භාරදීම/සේවාව සඳහා මිලගණන් ඉදිරිපත් කරනු ලබන සියළුම ලංසු තබන්නන් එකතුකල අගය මත බදු වෙනුවෙන් (VAT) ලියාපදිංචිය තිබිය යුතුය. එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් අදාල භාණ්ඩ/සේවාව සඳහා බදු ගෙවීම අදාළ නොවේ නම් ඒ සඳහා අදාළ වන පනතේ ගැසට් නිවේදනය අනුව වත්මන් මුදල් වර්ෂය වෙනුවෙන් ආදායම්බදු දෙපාර්තුමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් විසින් සහතික කර ආයතනය නමට ලබා ගත් සහතිකයේ ඡායාපිටපතක් ඉදිරිපත් කළ යුතුය.

6. <u>මිලගණන් ඉදිරිපත් කිරීම</u> :ලංසු තබන්නන් විසින් මිලගණන් ඉදිරිපත් කිරීමේදී මෙම මිල කැඳවීමේ නිවේදනයේ සඳහන් කොන්දේසි වලට එකඟ විය යුතුය. සියළුම මිලගණන්පත් ආයතනයේ නිළ මුද්‍රාව සහ අවසරලත් නිළධාරියෙකු විසින් නිසි පරිදි අත්සන් කර ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන මිලගණන්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිලගණන් වසනු ලබන දිනයේ හෝ එම වේලාවට ප්‍රථම මුද්‍රා තැබූ මිලගණන්පත් 2025. 02 . 11 දින පෙ.ව 1030 ට ප්‍රථම අංක 462/2, කඩුවෙළ පාර, ගනහේන, බත්තරමුල්ල ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ ගෙනවිත් භාරදිය හැක. තවද ෆැක්ස් මගින් හා විද්‍යුත් තැපැල මගින් ලැබෙන මිලගණන්පත් භාරගනු නොලැබේ.

7. ඉදිරිපත් කරනු ලබන මිලගණන්පත් ටෙන්ඩර් කොන්දේසි වලට එකඟ වන බවට අත්සන් තබා ඉදිරිපත් කිරීමට හැක. මිලකැඳවීමට අදාළ භාණ්ඩයේ සියලුම කාර්මික තොරතුරු **(Technical Literature)** පාරිභෝගික අත්පොත. රූප සටහන් **(Pamphlets and drawing)** අදාළ වන පරිදි මිලගණන්පත සමඟ අමුණා එවිය යුතුය. **Virus Guard** භාවිතා කරන වර්ෂය තුල සිදු වන තාක්ෂණික ගැටළුවකදී එය නිවැරදි කිරිමට තාක්ෂණික සහාය ලබාදිය යුතුය.

8. <u>මිලගණන්පත් විවෘත කිරීම</u> : ඉදිරිපත් කර ඇති සියලුම මිලගණන්පත් වසනු ලබන දිනය සහ වේලාව අවසානයේදී එම ස්ථානයේදීම විවෘත කරනු ලබන අතර, එම දිනයේදී මිලගණන් විවෘත කරන ස්ථානය වෙත ලංසු තබන්නාට හෝ බලයලත් නියෝජිතයෙකුට පැමිණීමට අවකාශ ඇත.

9. **ප්‍රසම්පාදන කමිටු අයිතිය:** ඉදිරිපත් කරනු ලබන මිළගණන්පත් සම්පූර්ණ හෝ කොටස් වශයෙන් පිලිගැනීමක් සිදු කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව/පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් සතුවන අතර, එම තීරණය අවසාන තීරණය වේ. සාර්ථක සැපයුම්කරුවන් වෙත නිල වශයෙන් දැනුම්දීමක් සිදු කරන අතර, තෝරා නොගත් සැපයුම්කරුවන් සබැඳිව කිසිදු දැනුම්දීමක් සිදුකරනු නොලැබේ.

ඒඑම්ඩබ්ලිව්පී අබේසේකර
ලුතිතන් කර්නල්
සහකාර කොමසාරිස් (ප්‍රසම්පාදන)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් වෙනුවට

මම/අප විසින් ඉහත සඳහන් ටෙන්ඩර් කොන්දේසි සඳහා එකඟ වන අතර මා/අප වෙත ටෙන්ඩර් ප්‍රධානය කරනු ලැබුව හොත් භාණ්ඩ/සේවාව නිවැරදි පිරිවිතරයට හා ප්‍රමිතීන්ට අනුව මාගේ මිලගණන්පතෙහි දක්වා ඇති සැපයීම් කාලසීමාව හෝ ලබා දෙනු ලබන කාලසීමාව තුළදී සැපයීමට මා/අප සමාගම ක්‍රියාකරනු ලබන බවට එකඟවනු ලැබේ.

……………………………………………….
අත්සන

……………………………………………….
ඉහත සඳහන් කර ඇති අයගේ සම්පූර්ණ නම

……………………………………………….
ආයතනයේ නම

……………………………………………….
ආයතන නිළ මුද්‍රාව

BR/PROC/HQ/2025/002 හා 2025. 01 .31 දින ලිපියට ඇමුණුම "අ" වශයෙනි.

දේශීය වශයෙන් භාරදෙනු ලබන භාණ්ඩ/සේවා සඳහා මිලගණන් උපලේඛණය

| අ/අ | භාණ්ඩ විස්තරය | අවශ්‍යා ප්‍රමාණය | වෙළඳ නාමය | වගකීම් කාලය | ඒකක මිල රු. (VAT රහිත) | මුළු මුදල රු. (VATරහිත) |
|---|---|---|---|---|---|---|
| 1 | Server Edition Virus Guard 2025 ( For 105 computers) | 01 | | | | |
| 2 | Single User Virus Guard 2025 | 134 | | | | |
| එකතුව | | | | | | |
| ප්‍රවාහන ගාස්තුව | | | | | | |
| වැට් බද්ද 18% | | | | | | |
| සම්පූර්ණ එකතුව | | | | | | |

1. වලංගු කාල සීමාව (දින 60ක් හෝ ඊට වැඩි) :…………………………………………………………..

2. භාණ්ඩ සැපයීමට ගත වන කාලය :……………………………………………………………………………

(සැ.යු: ටෙන්ඩරය අනුමත වුවහොත් මිලදී ගැනීමේ ඇණවුම නිකුත් කළ දින සිට දින 14ක් ඇතුළත භාණ්ඩ සපයා නිම කළ යුතුයි.)

3. ප්‍රවාහනය සම්බන්ධ තොරතුරු: ………………………………………………………………………………

(මෙම Virus Guard අංක 462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල දරණ ලිපිනයෙහි ස්ථාපිත පුනරුත්ථාපන කාර්යාංශය වෙත රැගෙන විත් භාර දීමට ක්‍රියා කළ යුතුයි.)

4. ආයතනයේ නම :……………………………………………………………………………………

5. ලිපිනය:……………………………………………………………………………………………

6. දුරකථන අංකය:………………………………………………………………………………………

7. ෆැක්ස් අංකය:………………………………………………………………………………………

8. විද්‍යුත් තැපැල් ලිපිනය:………………………………………………………………………………

9. එකතු කල අගය මත බදු ලියාපදිංචි අංකය:…………………………………………………………..

10. ආයතනයේ නිල මුද්‍රාව :……………………………………………………………………………

11. ලංසු ඉදිරිපත් කරන්නාගේ අත්සන:……………………………………………………………………

12. ලංසු ඉදිරිපත් කරන්නාගේ නම:………………………………………………………………………..

13. දිනය:………………………………………………………………………………………………

14. මිල ගනන්පත ලබා ගත් ආකාරය :………………………………………………………………………

**සැලකිය යුතුයි**

වට්ටම් මුදලක් ලබාදෙන්නේ නම් එම වට්ටම් මුදල අඩු කර මිල ගණන් ඉදිරිපත් කළ යුතුයි.

- විද්‍යුත් තැපැල් හා ෆැක්ස් මාර්ගයෙන් ලැබෙන මිල ගණන්පත් නොසලකා හරිනු ලැබේ.
- විමසීම :011-2577457
- මිලගණන්පත් පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාර දිය හැකිය.

**අංක :462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල**

**ඒඑම්ඩබ්ලිව්පී අබේසේකර**

ලුතිතන් කර්නල්

සහකාර කොමසාරිස් (ප්‍රසම්පාදන)

පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් වෙනුවට